
# මගේ චන්ඩි මල්ලියා



වෙනුලි නෙතම්සා හරස්ගම

# මගේ චන්ඩි මල්ලියා

වෙනුලි නෙතුම්සා හරස්ගම

| | | |
|---|---|---|
| **ප්‍රථම මුද්‍රණය** | **:** | **2025.02.08** |
| **කර්තෘ** | **:** | **වෙනුලි නෙතුම්සා හරස්ගම** |
| **කතෘගේ වෙනත් කෘති** | **:** | **අකීකරු වඳුරු පැටියා**<br>**නත්තල් තෑග්ග**<br>**ලස්සන සමනලයා** |
| **ලිපිනය** | **:** | **නො.44,**<br>**කෙලින් වීදිය,**<br>**තලාතුඔය.** |
| **ISBN අංකය** | **:** | **978-624-208-213-4** |

**මුද්‍රණය**
**“PRESS”**
**නො.24, කොටුගොඩැල්ල වීදිය,**
**මහනුවර.**

# පිදුම

දැනුමෙන් පෝෂණය කරන්නට
වෙර දරන,
මාගේ සදාදරණීය විදුහල්පතිතුමිය,
පංතිභාර ගුරුතුමිය,
ඇතුළු ගුරු මව්පියන්ටත්,
මා පෝෂණය කරන,
ඇතිදැඩි කරන
මාගේ මව්නි, පියාණෙනි ඔබ
දෙපලටත්,
මා වැනිම දැනුම හඹා යන
මාගේ සොයුරු කැළටත්
මේ පොත ආදරයෙන් පුද කරමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි. ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරුදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන ''**හෙරණගත්කරණී**'' ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.



මගේ මල්ලීගේ නම
කේෂව. මල්ලිට තාම
අවුරුදු 03 යි.
එයා තාම පොඩි.
ඒත් මගේ මල්ලී හරිම සැරයි.
ඒ වගේම හරිම දඟයි.

අත්තම්මා නම් කියන්නේ
කොල්ලෝ පොඩි කාලේ දඟයි
තමා.
මම වගේ ලොකු
වුණාහම දඟ අඩු වෙයි
කියනවා.



ඔන්න ඉතින් දවසක්
මායි මල්ලියි සෙල්ලම් කර කර
හිටියා.

ටික වේලාවකින් මම
බලනකොට මල්ලී නෑ.

මාත් හොඳටම බය වුණා.
අම්මාගෙන් බැනුම්
අහන්න වෙයි කියලා.

මම කාටවත් නොකියා
හොයලා බැලුවා මල්ලි
කෝ කියලා.



මට එලියෙන් සද්දයක් ඇහුනා.
මල්ලිගේ වගේ.

මම බලනකොට මල්ලී
එළියෙ වතුර ටැප් එක ඇරලා.
එයා වතුර නාගෙන ඔළුවේම

මම අම්මාට කතා කරා.
අම්මා ඇවිත් ටැප් එක වහලා
මල්ලිව ගෙට ගත්තා.




කලින් දවසේ අම්මා මල් පැල
වලට වතුර දාන කොට මල්ලි
බලන් හිටියා.
ඒක තමා මල්ලි ආයේ
පාරක් තනියම ගිහින් තියෙන්නේ.

අම්මා මල්ලිව මොන්ටිසෝරියකට
දැම්මා.
මුල් දවස් දෙක තුනක් නම් අම්මා
දාලා එනකොට
ඇඬුවා කිව්වා.



අම්මාට දුක හිතුනාලු.
ඒත් ලොකු ඉස්කෝලේ
යනකොට
කොහොමත් පුරුදු වෙන්න
ඕනිනේ කිව්වා.

ටික දවස් ගියා.
මල්ලිගෙන් මොන්ටිසෝරියෙනුත්
පැමිණිල්ලක්.
අම්මා හොඳටම බයවුණා.
පහුවදා උදේ මල්ලි



එක්කම මොන්ටිසෝරියට ගියා
ටීචව හම්බෙන්න.
මල්ලි මොකද කරලා තියන
දඟ වැඩේ අහන්ඩ.
ටීච කියලා අම්මාට.


කේෂව සෙත් කියන තව මල්ලි
කෙනෙකුයි
සෙල්ලම් කර කර ඉදලා.
එක පාරටම සෙත් හයියෙන්
අඬලා.



ටීච ඇවිත් බලනකොට සෙත්
ගේ අත හොඳටම හපලාලු.
කේෂවගේ දත් සෙට් එකම ඒ
මල්ලිගේ අතේලු.
සමහර තැන් වලින් ලේත්
ඇවිත්.


ටීච මොන්ටිසෝරියේදී බෙහෙත්
දාලා එයාව යවලා.

අම්මා රෑ වෙලා සෙත්ගේ
අම්මාට කතා කරලා මල්ලි
කරපු දේට සමාව ගත්තා.



අපේ මල්ලි දෙහි ගෙඩි
දෙකක් තරම් උස නෑ.
හැබැයි කරන්ඩ හදන්නේම
ලොකු ලොකු දේවල් මයි.


එයාගේ සපත්තු තියෙද්දී
එයා අප්පච්චිගේ සපත්තු
දාගෙන
ඇවිදිනවා. ඒවා ලොකු නිසා
පැටලිලා වැටෙනවා.
ඊට පස්සේ ගේ දෙක වෙන්ඩ
අඬනවා.



අම්මා නම් කියනවා මමත්
පොඩි කාලෙත් ඒ වගේමලු.
අම්මාගේ හැන්ඩ් බෑග් කරේ
දාගෙන අම්මාගේ සපත්තු
දාගෙන ඇවිදිනවාලු.

හැබැයි මල්ලි තරම් දඟ නම්
නෑලු.

ඔන්න ඉතින් ටික දවසක්
මල්ලි මොන්ටිසෝරියේ හොඳ
ළමයෙක් වගේ ඉඳලා



ආයෙමත් දවසකට මල්ලිගේ
මොන්ටිසෝරියේ ටීච අම්මාට
කතා කරා.

මල්ලි ආයෙමත් තව පොඩි
මල්ලි කෙනෙක්ට ගහලා.
මේ සැරේනම් ටිකක් සැරටම
ගහලා.


ටීච කියලා තියෙන්නේ මල්ලි
සෙල්ලම් කර කර හිටපු
සෙල්ලම් බඩුව තව පොඩි මල්ලි
කෙනෙක් ඇදලා.

ඉතින් මගේ මල්ලිට තරහා ගිහින්
ඒකෙන්ම එයාගේ නලලට ගහලා.

නලල තුවාල වෙලාලු.
ඒ මල්ලිගේ අම්මා ඇවිත්.
ඒ මල්ලිව එක්කගෙන ගිහින්.
බෙහෙත් දාන්ඩ.

ඒ මල්ලිට මැහුම් දෙකක් දාලලු.
ටික දවසක් යනකම් ඒ
මල්ලි ආවේ නෑලු මොන්ටිසෝරි.





අපේ මල්ලි කොහොමත්
හිතන් ඉන්නේ හැමදේම
එයාගේ කියලා.

මගේ පැන්සල් පෙට්ටි
පාට පෙට්ටි,මකනය ඔක්කොම
එයාගේ කියලා තමා හිතන්
ඉන්නේ.

මම මොනවා හරි වැඩක්
කරන්ඩ ගියාම එයත් එනවා.
එයාටත් ඒක කරන්ඩ දෙන්ඩ
ඕනි.




දුන්නේ නැත්නම් වානර
පැටියෙක් වගේ දෙනකම්
අඬනවා.

අම්මා නම් ඒ වෙලාටම වෙන
දෙයක් පෙන්නලා අඬන එක
නවත්ත ගන්නවා.

කොච්චර මාත් එක්ක රංඩු
කරත් මගේ බඩු ගත්තත් මට
අම්මා සැර කරන වෙලාවට
මල්ලි ඇවිත් අම්මාට සැර
කරනවා.

මල්ලි මට ගොඩක් ආදරෙයි.
මාත් මල්ලිට ගොඩක් ආදරෙයි.
මල්ලි ඉක්මනට ලොකු වෙනකම්
මට ඉවසිල්ලක් නෑ.

මගේ මල්ලිට බුදු සරණයි!...





# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්